**සීමාසහිත ලංකා පොහොර සමාගම - 2018/2019**

**---------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

සීමාසහිත ලංකා පොහොර සමාගමේ ("සමාගම") 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශනසම්බන්ධයෙන් අදහස් දැක්වීම
---------------------------------------------------

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | ---------------------- | ------------ |
| (අ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 07හි 38 වන ඡේදය ප්‍රකාරව වගකීම් සඳහා ඇපකරයක් ලෙස තබාගෙන ඇති මූල්‍ය වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුල ණයවර ලිපි විවෘත කිරීම සඳහා ඇපකර ලෙස තබා ඇති රු. 710,000,000 ක් වූ ස්ථාවර තැන්පතු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | අතපසුවීමකින් ගිණුම්වල හෙළිදරව් කර නොමැත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සමාගම පිහිටි ඉඩමෙහි අයිතිය සමාගම නමට පවරා ගැනීමෙන් තොරව එම අගය පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.1,720,000,000 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය තුල රු.1,868,965,707 කට ප්‍රත්‍යාගනනය | කැළණිය ප්‍රාදේශිය ලේකම් විසින් ඉඩමේ අයිතිය සමාගම වෙත පවරාදීම සඳහා වූ අදාල ලිපි ලේඛන ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත 2016 දෙසැම්බර් 26 දින | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සමාගම වෙත පවරා ගෙන මූල්‍ය ප්‍රකාශණවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර සමාගමේ වත්කම් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම්වල අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉඩම් අමාත්‍යාංශය මගින් ජනාධිපති වෙත යොමුකර අදාල අනුමැතිය ලබාගැනීමට නියමිතව ඇත. | |
| (ඇ) | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පර්චස් 28 ක ඉඩමෙහි අයිතිය සමාගම නමට පවරා ගැනීමෙන් තොරව එම ඉඩම වෙනුවෙන් සමාගමට ලැබිය යුතු වන්දි ලෙස රු.12,600,000 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | පර්චස් 28 ක ඉඩම කොළඹ කටුනායක අධිවේගී මාර්ගය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පවරා ගන්නා ලදී. භූමියෙහි පිහිටි ගොඩනැගිලි සඳහා වන්දි ලබාදුන් අතර ඉඩමේහි අයිතිය නොමැති නිසා වන්දි ලබා දී නැත. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම කළ යුතුය. |
| (ඈ) | සමාගම විසින් පොහොර ගබඩා කරනු ලබන අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගබඩාව පිහිටි ඉඩම සඳහා 2015 අප්‍රේල් 01 සිට 2019 මාර්තු 31 දක්වා වාර බදු හා දඩ ලෙස රු.6,460,000 ක් ගෙවිය යුතු වුවද එම අගය මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | මෙම මුදල ලබන වර්ෂයේ ගිණුම් වලට ගැලපීමට කටයුතු කරනු ඇත. | රු. 6,460,000 ක් වූ වාර බදු හා දඩ මූල්‍ය ප්‍රකාශන තුල පෙන්නුම් කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වෙළෙඳ ණයගැතියන් | 156,833,043 | ශේෂ සනාථන ලිපි | ශේෂ සනාථන ලිපි ලද වහාම එම ලිපි ලබාදීමට කටයුතු කරනු ඇත. | ශේෂ සනාථන ලිපි විගණනයට ලැබීමට කටයුතු කල යුතුය. |
| (ආ) | විවිධ ණයගැති ශේෂ | 105,534,809 | ශේෂ සනාථන ලිපි | ශේෂ සනාථ කර ගැනීම සඳහා ලිපි යවා තිබුනද තහවුරු කිරීම් ලැබී නොමැත. | ශේෂ සනාථන ලිපි විගණනයට ලැබීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | මහා භාණ්ඩාගාර යෙන් ලැබිය යුතු ශේෂ | 19,159,274,649 | ශේෂ සනාථන ලිපි | ශේෂ සනාථ කර ගැනීම සඳහා ලිපි යවා තිබුනද තහවුරු කිරීම් ලැබී නොමැත. | ශේෂ සනාථන ලිපි විගණනයට ලැබීමට කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | වෙළඳ ණයහිමි ශේෂ | 5,621,686,832 | ශේෂ සනාථන ලිපි | ශේෂ සනාථ කර ගැනීම සඳහා ලිපි යවා තිබුනද තහවුරු කිරීම් ලැබී නොමැත. | ශේෂ සනාථන ලිපි විගණනයට ලැබීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | විවිධ ණයහිමි ශේෂ | 31,753,673 | ශේෂ සනාථන ලිපි | රු.31,753,673 ක් වූ වටිනාකම් සඳහා ශේෂ සනාථ කර ගැනීම ජර්නල් සටහන් සහ ගෙවීම් වවුචර්පත් මගින් සිදුකර ගතහැක. | ශේෂ සනාථන ලිපි විගණනයට ලැබීමට කටයුතු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දක්වා ඇත.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් මස 07 දිනැති අංක PED 03/2018 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව සමාලෝචිත වර්ෂයේදී සේවකයින්ට දිරිදීමනා ලෙස රු. 40,739,916 ක් ගෙවා තිබුණි. | දිරිදීමනා ගෙවීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට අදාල තොරතුරු ඉදිරිපත් කර තිබුණද ඒ සඳහා අනුමැතිය හෝ අනුමැතිය ලබාදිය නොහැකි බව හෝ දක්වා නොමැත. අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ගෙවීම් සිදු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 ජූලි මස 10 දිනැති අංක 02/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාහන අපහරණය පිළිබඳ තොරතුරු රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද අපහරණය කරන ලද වාහන 06 කට අදාළ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වාහන අපහරණ ක්‍රියාවලියේදී චක්‍රලේඛයට අනුකූලව අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කරන ලද වාහන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් පෙන්වා දී ඇති යහපාලනය සඳහා වූ පොදු ව්‍යාපාර මගපෙන්වීම් අත්පොතෙහි 06 පරිච්ඡේදය 5.1 වගන්තිය | සෑම රාජ්‍ය සමාගමක් විසින්ම ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත අදාල මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත් වාර්ෂික වාර්ථාව සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාගම විසින් අදාල මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2019 ජූලි 31 දිනදී ය. | 2019 අප්‍රේල් මාසයේදී සිදු වූ බෝම්බ ප්‍රහාරය නිසා පැවති ප්‍රවාහන අපහසු තත්වයන් සහ පැවති වතාවරනයන් නිසා නිලධාරීන්ගේ පැමිණීම අඩාල වීමෙන් ගිණුම් පිළියළ කිරීමේ කටයුතු සිදුකර ගැනීමට නොහැකි විය. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාව සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.34,506,078 ක අලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු.24,536,064 ක් විය. ඉකුත් වර්ෂය හා සැසදීමේදී බදු පසු අලාභය රු.9,970,014 කින් වැඩිවී තිබුණි. මෙම අලාභය වැඩිවීමට පරිපාලන වියදම්, බෙදාහැරීම් වියදම් සහ මූල්‍ය පිරිවැය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් දියර පොහොර මිලදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එලඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.4.5 ඡේදය ප්‍රකාරව ආනයනය කරන භාණ්ඩ සඳහා පමණක් ඇප සුරක්ෂණ තැබිය යුතු වුවද , එහෙත් ගිවිසුමේ 6.5 ඡේදය ප්‍රකාරව රු.මිලියන 125 ක බැංකු ඇප සුරක්ෂණ දෙකක් කාබනික දියර පොහොර ලබාගැනීම සඳහා තබා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 5.4.5 ඡේදය ප්‍රකාරව ආනයනය කරන භාණ්ඩ සඳහා පමණක් ඇප සුරක්ෂණ තැබිය යුතු නමුදු එම වාර්ථාවේ සඳහන් දියර පොහොර සැපයුම්කාර සමාගමට රු. මිලියන 112.5 ක | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එම බැංකු ඇප සුරක්ෂණ උපයෝගී කරගෙන සැපයුම්කාර සමාගම විසින් රු. මිලියන 112.5 ක බැංකු අයිරා පහසුකම් ලබාගෙන තිබුණු අතර පසුව බැංකු ඇපකරය වෙනුවට සමාගම සතු රු.94,438,766 ක් වටිනා ස්ථාවර තැන්පතු 02ක්, සැපයුම්කාර සමාගම විසින් ලබාගෙන තිබූ බැංකු අයිරාවේ එදිනට පැවති ශේෂය සඳහා 2018 ජුනි මස 15 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී බැංකු ඇපකර වශයෙන් තැබීමට කටයුතු කර තිබුණි. | බැංකු අයිරා පහසුකමක් සමාගමේ ස්ථාවර තැන්පතු ඇපයට තබා ලබා දී ඇති බව නිවැරදි වේ. එහෙත් 2018 ජුනි 15 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී රු. 94,438,766 ක් වටිනා ස්ථාවර තැන්පතු 02ක් එම ණය මුදලට ඇප වශයෙන් තැබීමට අනුමැතිය ලබාදී එසේ සිදු කරන ලද්දේ එතෙක් පැවති රුපියල් මිලියන 240 ක වටිනාකමකින් යුත් ස්ථාවර තැන්පතුව නිදහස් කර ගැනීම අරමුණින් බව සඳහන් කරමි. | |
| (ii) | එම බැංකු අයිරාවෙන් 2019 පෙබරවාරි 12 දින වන විට නොගෙවා ඉතිරිව පැවති රු.75,980,000 ක ශේෂය සම්බන්ධව අදාල බැංකුව විසින් සමාගමේ කළමණාකාරීත්වය වෙත කිහිපවතාවක්ම දැනුවත් කර තිබුණද කළමණාකාරීත්වය ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම මත එම හිඟ ශේෂය සහ රු.4,522,099 ක පොලී මුදල ද සමඟ රු.80,502,290 ක මුදලක් ඇපයට තබා තිබූ සමාගම සතු ස්ථාවර තැන්පතු දෙකෙන් අයකර ගෙන තිබුණි. එහෙත් අදාළ ගිවිසුම අනුව බැංකු අයිරාව පියවීමට දියර පොහොර සමාගම විසින් කටයුතු කර නොතිබුණ අතර සමාගමේ කළමනාකාරිත්වය එම මුදල අයකර ගැනීමටද අපොහොසත් වී තිබුණි. | වාර්තාවේ සඳහන් කර ඇති පරිදි පැවති ණය මුදල සහ ඊට අදාල පොලී වටිනාකම වූ රු. 80,502,290 ක මුදල බැංකුව විසින් ඇපයට තබා තිබූ සමාගමේ ස්ථාවර තැන්පතු 02 න් අයකරගෙන තිබූ බව පිළිගනිමි. | මේ සම්බන්ධව වගකිවයුතු නිළධාරීන්ට එරෙහිව කටයුතු කළ යුතු අතර අදාල මුදල් එම සමාගමෙන් අයකර ගැනීමටද කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කිරික්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවසන් තොගය තුල සමාලෝචිත වර්ෂයේ හඳුනාගත් රු.1,393,587 ක නිකුත් නොවන පොහොර තොගයක් පැවතීම හේතුවෙන් වර්ෂය තුල ආනයනය කරන ලද පොහොර ගබඩා කිරීම සඳහා ගබඩා | මෙම තොග 2019 ඔක්තොබර් 01 දින වන විට රජය සතු ආයතන මගින් පවත්වාගෙන යනු ලබන ගොවිපොලවල් වෙත පරිහරණය සඳහා නොමිලේ ලබාදීමට කටයුතු කර ඇත. සමාලෝචිත වර්ෂයට හඳුනාගත් | නිකුත් නොවන පොහොර තොග සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ප්‍රමාණවත් පරිදි ගබඩා ඉඩකඩ පහසුකම් ලබා ගැනීමට කටයුතු කල |

| | | | |
|---|---|---|---|
| | පහසුකම් ප්‍රමාණවත් නොවන මට්ටමක පැවති බව විගණනයට නිරීක්ෂණය විය. | නිකුත් නොවන පොහොර තොගය ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා ජාතික පොහොර ලේකම් කාර්යාල අනුමැතිය යටතේ පෙර සඳහන් කළ පරිදි රජයේ ආයතන වෙත නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | යුතුය. |
| (ආ) | ජනතා වතු සංවර්ධන මණ්ඩලය, අම්පාර කෘෂිකර්ම අධ්‍යක්ෂ සහ රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු වසර 10 කට වඩා පැරණි රු. 86,408,870 ක ශේෂයන්, බෙදා හැරීමේ නියෝජිතයන් තිදෙනෙකුගෙන් ලැබිය යුතු වර්ෂයකට වඩා පැරණි රු. 47,385,977 ක ශේෂයන්, ගණුදෙනුකරුවකුගෙන් ලැබිය යුතු වර්ෂයකට වඩා පැරණි රු.10,230,000 ක ශේෂය සහ මහියංගනය ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලැබිය යුතු රු.1,839,321 ක ශේෂය අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් සාකච්ඡා මාර්ගයෙන් මුදල් අයකර ගැනීමටත් අනෙකුත් ආයතන සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමටත් කටයුතු කර ඇත. | අදාල ණයගැති ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | වසර 05 කට වඩා පැරණි රු. 6,644,781 ක වෙනත් ලැබිය යුතු ශේෂයක් සහ 2015 වර්ෂයේ සිට පැවත එන පොතුවිල් ගබඩාවේ පොහොර තොග ඌනතාවයට අදාළව තොග නිලධාරිගෙන් අය විය යුතු රු.7,694,938 ක ශේෂයක් දක්වා තිබුණද එම ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සමාගම විසින් සමාලෝචිත වර්ෂය දක්වාම ගෙන නොතිබුණි. | නීතිමය කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. | මෙම ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාගම විසින් ශ්‍රී ලක් පොහොර සමාගම වෙත හුවමාරු පදනම මත ලබාදුන් රු.මිලියන 5ක ශුද්ධ වර්තමාන අගයකින් යුතු පොහොර මෙ.ටො.250 ක ප්‍රමාණය ගිවිසුම ප්‍රකාරව 2019 ජනවාරි 31 දිනට ප්‍රථම ලබාදිය යුතු වුවත්, 2019 අගෝස්තු 31 දින දක්වාම එම පොහොර තොග ප්‍රමාණය භාර දී නොතිබුණද සමාගම විසින් ගිවිසුම් ප්‍රකාරව එම පොහොර තොගය ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරි කාර්තුවේදී ආනයනය කිරීමට කටයුතු කර ඇති පොහොර තොගයෙන් මෙම යූරියා පොහොර මෙ.ටොන් 250 ක ප්‍රමාණය නැවත ලබා දීමට එකඟ වී ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර එම පොහොර තොග කඩිනමින් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | ආනයනය කරන ලද පොහොර වලට අදාල ලිපිගොනු නිසිලෙස සම්පූර්ණ කර එයට අදාල ලේඛන සමඟ ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, 2018 අප්‍රේල් 06 දිනට පැවති තොගය සඳහා රු.184,117,534 ක් හා 2018 මැයි මස ලද පොහොර සඳහා රු.182,078,147 ක් වූ පොහොර සහනාධාර මුදල් 2019 මාර්තු 31 දින වන විටද සමාගමට ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | ඉදිරි වර්ෂයේදී අදාල ලිපි ගොනු නිසිලෙස සම්පූර්ණ කර එම ලේඛන සමඟ ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.එමෙන්ම අදාල අංශ වෙත මෙම ලේඛන ඉතා කඩිනමින් ලබාදෙන ලෙස ලිඛිතව දැනුම් දී ඇත. | අදාල ලේඛන සම්පූර්ණ කර භාර දීමත් මේ සම්බන්ධව කටයුතු කල නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් සිදු කළ යුතුය. |
| (ඊ) | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 ඔක්තෝම්බර් 05 දිනැති ලිපිය අනුව පොහොර ආනයනය සඳහා විවෘත කල ණයවර ලිපි වලට අදාලව ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් බැංකුව විසින් අයකල පොලිය පියවීම පොහොර සමාගම සතු වගකීමක් බව දන්වා තිබුණි. එහෙත් පොහොර සමාගම සතු රු.බිලියනයකට අධික කාලීන තැන්පතු තිබියදී 2018/19 වර්ෂයේ ණයවර ලිපි කල්පිරීම මත නොපියවූ ප්‍රමාණය කෙටිකාලීන ණය මුදලක් ලෙසට පරිවර්තනය කර ඒ සඳහා ණය පොලී වශයෙන් | සමාගමේ ණයවර ලිපිවලට අදාල ගෙවීම් කිරීමේදී කෙටි කාලීන බැංකු ණයක් මගින් එම බිල්පත් පියවා සහනාධාර මුදල් ලද පසු කෙටිකාලීන ණය පියවනු ලබයි.<br>එසේ සිදුකරනු ලබන්නේ සහනාධාර මුදල් කඩිනමින් ලැබේ යැයි අපේක්ෂාවෙනි. නමුත් අප වෙත නිසි පරිදි නියමිත දිනට සහනාධාර මුදල් නොලැබීම හේතුවෙන් පොලී වශයෙන් රු. 36,267,366 ක් ගෙවීම් කිරීමට සිදුව ඇත. තවද ණයවර ලිපි සඳහා ගෙවීම් කිරීමේදී අපගේ ස්ථාවර තැන්පතු කල් පිරීමට පෙර ආපසු ලබා ගතහොත් එය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූලව ණයවර ලිපි වලට අදාල ගෙවීම් සිදුකර රජයේ මුදල් ඵලදායි ලෙස යෙදවීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.36,267,366 ක් ගෙවීම් කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ නියමිත පරිදි එම ගෙවීම් සිදු කිරීම අදාල නිලධාරීන්ගේ වගකීම වුවත් එම නිලධාරීන්ගේ නොසැළකිල්ල හේතුවෙන් සමාගමට විශාල මුදලක් පොලී ලෙස ගෙවීමට සිදු වී තිබුණි. | වට්ටම් කිරීමෙන් පොලී වශයෙන් ලැබීමට නියමිත වටිනාකමින් විශාල මුදලක් සමාගමට අහිමි වී යන බව සඳහන් කළ හැක. | |
| (ඍ) | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ පොහොර ගබඩා ඉදිකිරීම්, අභ්‍යන්තර මාර්ග සංවර්ධනය ඇතුළු කොන්ත්‍රාත් යටතේ රු.මිලියන 256.08 ක ප්‍රසම්පාදන සිදු කිරීමට සැලසුම් කර තිබුණද එම ප්‍රසම්පාදන සියල්ල වර්ෂය තුලදී සිදු නොකිරීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | ඉහත සඳහන් සියලුම ඉදිකිරීම් කටයුතු 2018/2019 සංයුක්ත සැලැස්මේ සහ 2018/2019 ක්‍රියාකාරී සැලැස්මේ කාර්තුමය වශයෙන් නිම කිරීමට කටයුතු සංවිධානය කරමින් පවතී. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව කටයුතු සිදුකල යුතුය. |
| (ඎ) | සමාගම සතුව ආදායම් ඉපයිය හැකි ශ්‍රී ලංකා අනුකූලතාවය අගය කිරීම් පැවරීමේ මණ්ඩලයෙහි (Sri Lanka Accreditation Board) ලියාපදිංචිය ලත් රු.18,557,867 ක් වටිනා රසායනාගාර උපකරණ සහිත රසායනාගාරයක් පැවතියද, සමාලෝචිත වර්ෂය තුල දී රු.380,750 ක ආදායමක් පමණක් උපයා තිබීම හේතුවෙන් ආදායම් ඉපයීමට හැකිවන ආකාරයේ උපායමාර්ගික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු බවත් ඒ අනුව රසායනාගාරය සතු සම්පත් ඌන උපයෝජිත තත්වයේ පැවතුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය. | රසායනාගාරය සහ එහි කාර්ය මණ්ඩලය ද්විතීය පදනම මත කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත හෝ එසේ නොමැති නම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙනම ආයතනයක් ලෙස පවත්වාගෙන යාම පිළිබඳව ඇති හැකියාව අමාත්‍යාංශය සමග සාකච්ඡාකර තීරණයක් ගැනීමට නියමිතව ඇත. | රසායනාගාරය සතු උපකරණ වලින් උපරිම ඵලදායිතාවයක් ලබාගැනීමට කටයුතු කල යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාගමේ සේවය කරනු ලබන සේවකයන්ට උසස්වීම් ලබාදීමේ දී බඳවා ගැනිමේ පටිපාටිය අනුව අදාල සුදුසුකම් සපුරාලිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුලදි සමාගමේ කළමණාකරු (පරිපාලන හා මානව සම්පත්) සහ සහකාර කළමණාකරු (මුදල්) යන තනතුරු සඳහා සමාගමේ සේවය කරනු ලබන නිලධාරින් දෙදනෙකු, අදාල සුදුසුකම් සපුරා නොතිබියදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එම තනතුරු සඳහා උසස් වීම් ලබා දී තිබුණි. | සහකාර කළමනාකරු (මුදල්) තනතුර සඳහා දේශපාලන පළිගැනීම් මත අසාධාරණයක් සිදු වී ඇති බැවින් එම නිළධාරියාටද කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්) යන තනතුර සඳහා පත්කල නිලධාරියා විශ්‍රාම යාමට ආසන්නව ඇති බැවින් ඔහුගේ සේවා කාලය සලකා මෙම තනතුරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ලබා දීමට කටයුතු කර ඇත. | බඳවා ගැනීමේ පටිපාටියට අනුව අදාල උසස්වීම් ලබාදීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කළමණාකරු (ප්‍රසම්පාදන) යන තනතුර සඳහා වැඩබැලීමේ පදනම මත නිලධාරියකු පත්කර තිබුණ ද, එම පුරප්පාඩුව පිරවීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මෙම තනතුර සඳහා නැවත බඳවාගැනීමට 2019 සැප්තැම්බර් 21 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ගෙන ඇත.ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව පුරප්පාඩුව පිරවීම සඳහා කටයුතු කරනු ලැබේ. | තනතුර සඳහා ස්ථිර ලෙස බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |